

# මෙගාවලට බනින අයම මෙගාවල රඟපානවා

## කැලුම් පාලිත මහීරත්න

## විසුළ අහස යට

under the strewn skies



*ප්‍රවීණ නිවේදිකා අනෝමා වත්තලදෙණිය 'අක්කර පහ' චිත්‍රපටයේ රඟපෑමෙන් පසු, වසර 40ත පමණ කාලයකට පස්සෙ රංගනයට යළි එකතුවන්නෙ විසුළ අහස යට තුළින්. එසේම ප්‍රවීණ නළු විමල් කුමාර ද කොස්තා කලකට පසු රඟන ටෙලිනාට්‍යය මෙය. එපමණක් නොව, මෝස්තර නිරූපණ ක්ෂේත්‍රයේ ඉහළම තැනක සිටින හිරුන් යට්ටෝවිට සහ අමන්දා නිලූෂි මෙහි ප්‍රධාන නළු නිළි යුවළ මෙන්ම ඔවුන් දෙදෙනාගේ කුලුඳුල් ටෙලි නාට්‍ය රංගනයත් මෙයයි.*

*කැලුම් පාලිත මහීරත්න දශක දෙකහමාරක පමණ කාලයක සිට රූපවාහිනී ක්ෂේත්‍රයේ රැඳී සිටිමින්, බොහෝ සොඳුරු ලෙස සිනමාවද ස්පර්ශ කළ සෞන්දර්යවාදියෙකි. අතිශය ජනප්‍රිය වූ හත්දින්නත් තරු, රෝම පුරාණය, රාජ සභාව, බුද්ධ භූමි, අමා දහර වැනි වැඩසටහන් කැලුම්ගේ සංකල්පයන් ලෙස බිහි වූ නිර්මාණය. "නිලම්බරේ" කැලුම්ගේ කුලුඳුල් සිනමා අධ්‍යක්ෂයයි. ජනප්‍රිය නළු රන්ජන් රාමනායක හා හා පුරා කියා හොඳම නළුවා ලෙස සම්මානනීය වූයේත්, නව පරපුරේ කංචන කොඩිතුවක්කු හොඳම නැගී එන නළුවාට සම්මානනීය වූයේත් කැලුම්ගේ අධ්‍යක්ෂණය යටත්, නිලම්බරේ තුළිනි. රූපවාහිනියත්, සිනමාවත් සොඳුරු ලෙස ස්පර්ශ කරනා කැලුම් දෙවසරක පමණ කාලයක් යම් නිහැඬියාවක නිමග්නව හිටියා යැයි සිතේ. 'විසුල අහස යට' ඒ නිහැඬියාව බිඳ දමන්නට සමත්වූ නිර්මාණයකි.*

ඇත්ත. ටෙලි නාට්‍යයක්, චිත්‍රපටයක් නොකළ නිසා මගේ යම් නිහැඬියාවක් දැනෙන්න ඇති. ඒත් මම වෙළඳ දැන්වීම නිර්මාණකරණයෙහි යෙදී සිටියා. පසුගිය වකවානුවෙ අතිශය ජනප්‍රිය වූ එදිරිසිංහ ට්‍රස්ට් ඉන්වෙස්මන්ට් හි 'අප්පච්චි' මගේ නිර්මාණයක්. ඒ වගේම බ්‍රවුන්ස් ආයතනය වෙනුවෙනුත්, අද පුවත් පද වෙනුවෙනුත් මා වෙළඳ දැන්වීම් නිර්මාණය කළා. ඒ විතරක් නෙවෙයි ෘහර් පැතුම් විමන වැඩසටහන කරන්නෙත් මම. HNB පැතුම් විමන සඳහා වෙළඳ දැන්වීම් හයක් පමණ මම නිර්මාණය කළා. එහෙම බලද්දි මම නිහඬ වෙලා නැහැ.

කොහොම වුනත් විසුළ අහස යට මගේ නිර්මාණ දිවියේ සුවිශේෂී මං සලකුණක්. වෙළඳ දැන්වීම් නිර්මාණකරණයෙහි යෙදෙන කොට ඒ පිළිබඳව දැනගන්නේ ක්ෂේත්‍රයේ සිටින කීප දෙනෙක් විතරයි. දැන් විසුළ අහස යට නිසා කාලෙකට පස්සේ මමත් කළ එළි බැහැලා කියලා හිතෙනවා.

***කැලුම් නිෂ්පාදනයෙන් සහ අධ්‍යක්ෂණයෙන් හැඩවෙන විසුළ අහස යට මේ දිනවල සතියේ සෑම දවසකම රාත්‍රී 7ට හිරු TV ඔස්සේ විකාශය වෙනවා. හිරු TV ආරම්භයේදීම විකාශය වූ පළමු ටෙලි නාට්‍යය පෙස ' විසුළ අහස යට' ඉතිහාසගත වෙනවා. කෙසේ වුවත් විසුළ අහස යට තවත් එක් මෙගා ටෙලි නාට්‍යයක් පමණක් වෙයිද ?***

නැහැ. මං හැමදාමත් නැවුම් දෙයක් දෙන්න උත්සාහ කරන කෙනෙක්. විසුළ අහස යට කොටස් 120ක නාට්‍යයක්. මම කොටස් ගණනින් විතරක් නෙවෙයි, අන්තර්ගතයෙනුත් මෙගා නිර්මාණයක් ලෙස හඳුන්වන්න කැමතියි. මොකද අපේ රටේ බහුතරය මෙගා කියලා හඳුන්වන්නෙ, කොටස් ගාව වැඩි නාට්‍ය.

***මෙගා ටෙලි නාට්‍ය වලට බනින අයම මෙගාවල රඟපානවා ?***

ඔව්. මෙගාවලට බැන බැන හරි අපූරුවට රඟපානවා. ඒ ගැන ඇහැව්වහම කියන්නෙ ජීවත්වෙන්න තියෙන වෘත්තිය රඟපෑම නිසා අකැමැත්තෙන් මේකට එකඟ වුනා කියලා. ඒ උත්තර හරි විහිළුවක්. අකමැත්තෙන් කිසි දෙයක් කරන්නෙ නැහැ. ඒත් යම් විදිහකින් කරනවනම් ඒක හෙළා දකින්න හොඳ නැහැ. හෙළා දකිනවනම් කරන්න හොඳ නැහැ. මම එක උදාහරණයක් දෙන්නම්. මම මේ නාට්‍යයට මහේන්ද්‍ර පෙරේරාට කතා කළා. ඔහු කිව්වෙ, "ලොකු අයියගෙ වැඩකට එන්න ආසයි. ඒත් මෙගාවල මං රඟපාන්නෙ නැති නිසා එන්න බැහැ" කියලා. ඒක හරි ප්‍රතිපත්තිගරුක කමක්. අපි ඒකට අකමැතිනම් කීයක් හරි ලැබෙනවනෙ කියලා අපේ ප්‍රතිපත්ති පාවා දෙන්න ඕන නැහැ.

ප්‍රවීණ නිවේදිකා අනෝමා වත්තලදෙණිය 'අක්කර පහ' චිත්‍රපටයේ රඟපෑමෙන් පසු, වසර 40ත පමණ කාලයකට පස්සෙ රංගනයට යළි එකතුවන්නෙ විසුළ අහස යට තුළින්. එසේම ප්‍රවීණ නළු විමල් කුමාර ද කොස්තා කලකට පසු රඟන ටෙලිනාට්‍යය මෙය. එපමණක් නොව, මෝස්තර නිරූපණ ක්ෂේත්‍රයේ ඉහළම තැනක සිටින හිරුන් යට්ටෝවිට සහ අමන්දා නිලූෂි මෙහි ප්‍රධාන නළු නිළි යුවළ මෙන්ම ඔවුන් දෙදෙනාගේ කුලුඳුල් ටෙලි නාට්‍ය රංගනයත් මෙයයි. ශ්‍රියන්ත මෙන්ඩිස්, ඩග්ලස් රණසිංහ, ගිහාන් ප්‍රනාන්දු, රවීන්ද්‍ර යසස්, ගීතා කාන්ති ජයකොඩි, වැනි ප්‍රවීණ රංග ශිල්පීන්ගේ දායකත්වයත් විසුළ අහස ට ලැබුණා

ඒ එක්කම ජගත් ජේ එදිරිසිංහ මෙහි තේමා ගීතය රචනා කළා, අමල් පෙරේරා ගායනයෙන් ද ඇන්තනි සුරේන්ද්‍ර සංගීතයෙන්ද මෙයට දායක වුණා,

"විසුළ අහස යට" නිර්මාණය කරන්නට මට සහය දුන් මෙල්බන් හි අජිත් මාම්පිටිය, දිනේෂ් පෙරේරා, කාන්ති වික්‍රමසූරිය, අසෝක සුබසිංහ, ශ්‍රීනාත් මද්දුමගේ සහ ජගත් ජේ එදිරිසිංහ කියන හිතවතුන් මට අමතක කරන්න බැහැ.

*කවදත් සොඳුරු සෞන්දර්යයට බෙහෙවින් ඇළුම් කරන කැලුම්, විසුළ අහස යට හි රූපරාමුවෙන් රූපරාමුවට ඒ සොඳුරු බවත් සෞන්දර්යයත් නො අඩුව ඇතුළත් කරලා තිබීම සුවිශේෂයි.*

"ටෙලි නාට්‍යයක් හදලා, එය විකාශය කර ගැනීම දැන් ලොකු ප්‍රශ්නයක් වෙලා. මුදලට, දේශපාලනයට, බලයට වැඩි ඉඩකඩක් ඇති සමාජයක, ඒ සියල්ල ඉවත දමලා, නිර්මාණාත්මක ගුණය පමණක් සළකලා හිරු ටී.වී. ලබාදුන් මේ ඉඩකඩ අගය කළ යුතුයි." යනුවෙන් පැවසූ කැලුම්ගෙන් මම තවත් ප්‍රශ්නයක් ඇහැව්වා.

***ඔබේ මීළඟ සිනමා නිර්මාණය ?***

ඒකත් වැඩි ඈතක නෙවෙයි කියලා මට දැනෙනවා.

හර්ෂා සේනාධීර

**FOR ALL YOUR TAX AND ACCOUNTING NEEDS**

**THUSHARI WEERAKKODY**

CPA, MBA (Victoria University), Grad dip – Business admin. (La Trobe University), ACMA (UK – retired)

1st consultation free

**Mobile – 0401 072 360**
**E-mail - thushariw@bigpond.com**

•Personal and company tax returns
• BAS preparation
• Taxation advice
• Debt consolidation
• Superannuation and financial advice

20 years of experience in Sri Lanka and Australia
Friendly efficient and reliable service